# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2492/11 - 2026 ජුනි මස 09 වැනි අඟහරුවාදා - 2026.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය**

84 සහ 87 වගන්තීන් යටතේ දැන්වීම

1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 84 සහ 87 වගන්ති අනුව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු/හා ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් පවත්වාගෙන යන/ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදුකරනු ලබන මලාපවහන පද්ධතියට/ ජාලයට සම්බන්ධිතව ඇති පාරිභෝගිකයන්ගේ මලාපවහන ගාස්තු 2026 ජුනි 01 වැනි දින සිට පහත පරිදි සංශෝධනය කර ඇත.

2024 අගෝස්තු 21 දිනැති අංක 2398/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 2024 අගෝස්තු 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මලාපවහන ගාස්තු සම්බන්ධයෙන් සඳහන් වන දැන්වීම වෙනුවට මෙම නිවේදනය අදාළ වේ.

වෛද්‍ය **සුසිල් රණසිංහ**,
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය.

2026 ජුනි මස 05 වැනි දින,
නිවාස ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

1A - G 46952 — 04 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඕනෑම පරිශ්‍රයක මාසික මලාපවහන ගාස්තුවට, පරිහරණ ගාස්තුව, මාසික සේවා ගාස්තුව, අනිකුත් ගාස්තු සහ අදාළ බදු ඇතුළත් වේ. සියලුම මලාපවහන සේවා ලබන පාරිභෝගිකයන් පහත වගුවේ දැක්වෙන පාරිභෝගික ප්‍රභේදවලට වෙන්කර ඇත. එමගින් අදාළ වන මලාපවහන ගාස්තු අයක්‍රමය පහසුවෙන් හඳුනාගත හැක.

| පාරිභෝගික බාණ්ඩය | පාරිභෝගික ප්‍රභේද අංකය සහ ප්‍රභේදය | අදාළ වන ජල ගාස්තු අයක්‍රමය |
|---|---|---|
| ගෘහ බාණ්ඩය | ➢ 10 - ගෘහ<br>➢ 11- මණ්ඩල නිල නිවාස<br>➢ 13 - රජයේ නිල නිවාස<br>➢ 14 - වතු නිවාස (සමෘද්ධිලාභීන් නොවන)<br>➢ 16 - මණ්ඩල නිල නිවාස (අඹතලේ)<br>➢ 17 - නාගරික සංවර්ධනඅධිකාරියට අයත් නැවත පදිංචි කිරීම් සහාධිපත්‍ය නිවාස<br>➢ 18 - සහාධිපත්‍ය නිවාස ගෘහ<br>➢ 19 - තානාපති නිවාස - එකතු කළ අගය මත බදු අය නොවන<br>➢ 90 - තොග ජල සැපයුම් (පලාත් පාලන)<br>➢ 91 - තොග ජල සැපයුම් (ප්‍රජා මූල සංවිධාන) | අයක්‍රම වගුව 01 |
| වාණිජ බාණ්ඩය | ➢ 65 - රජයට අයත් ව්‍යවසාය ආයතන<br>➢ 70 - වාණිජ ආයතන<br>➢ 71 - සංචාරක හෝටල් සහ ආගන්තුක නිවාස<br>➢ 72 - නාවික<br>➢ 77 - මිශ්‍ර සංවර්ධන<br>➢ 78 - වරාය නගර<br>➢ 79 - තානාපති කාර්යාල - එකතු කළ අගය මත බදු අය නොවන වාණිජ ආයතන<br>➢ 80 - වෙනත් වාණිජ හා පෞද්ගලික ආයතන<br>➢ 82 - මණ්ඩල පරිශ්‍ර<br>➢ 73 - සුළු හා මධ්‍ය පරිමාන නොවන කර්මාන්ත<br>➢ 74 - ආයෝජන ප්‍රවර්ධන කලාප කර්මාන්ත<br>➢ 75 - සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත | අයක්‍රම වගුව 02 |
| පාසල්, පූජනීය සහ පුණ්‍යායතන බාණ්ඩය | ➢ 12 - රජයේ පාසැල්<br>➢ 15 - රජයේ උපකෘත පාඨශාලා<br>➢ 81 - ආගමික සහ පූජනීය ස්ථාන<br>➢ 85 - වෙනත් ලාභ නොලබන ආයතන<br>➢ 88 - රජයේ අනුමත පුණ්‍යායතන | අයක්‍රම වගුව 03 |
| රජයේ ආයතන බාණ්ඩය | ➢ 60 - රජයේ ආයතන<br>➢ 61 - යුධ හමුදා පරිශ්‍ර<br>➢ 62 - පොලිස් දෙපාර්තමේන්තු පරිශ්‍ර<br>➢ 63 - රජයේ රෝහල්<br>➢ 64 - පලාත් පාලන ආයතන පරිශ්‍ර | අයක්‍රම වගුව 04 |

**විවිධ අයක්‍රම සඳහා මලාපවහන ගාස්තු වගු**

**ගාස්තු අයක්‍රම වගුව I - ගෘහ බාණ්ඩය**

| ප්‍රභේදය | ජල පරිභෝජනය (ඝන මීටර) | මලාපවහන පරිහරණ අයක්‍රමය (ඝන මීටරයකට) (රු.) | සේවා ගාස්තුව (රු.) |
|---|---|---|---|
| ➢ 10 - ගෘහ | 00 - 05 | 10.00 | 250.00 |
| ➢ 11- මණ්ඩල නිල නිවාස | 06 – 10 | 10.00 | 400.00 |
| ➢ 13 - රජයේ නිල නිවාස | 11 - 15 | 15.00 | 400.00 |
| ➢ 14 - වතු නිවාස (සමෘද්ධිලාභීන් නොවන) | 16 - 20 | 22.00 | 500.00 |
| ➢ 16- මණ්ඩල නිල නිවාස (අඹතලේ) | 21 - 25 | 25.00 | 500.00 |
| ➢ 17- නාගරික සංවර්ධන අධිකාරියට අයත් නැවත පදිංචි කිරීම් සහාධිපත්‍ය නිවාස | 26 - 30 | 30.00 | 500.00 |
| ➢ 18 - සහාධිපත්‍ය නිවාස ගෘහ | 31 - 40 | 35.00 | 600.00 |
| ➢ 19 - තානාපති නිවාස - එකතු කළ අගය මත බදු අය නොවන | 41 - 50 | 45.00 | 600.00 |
| ➢ 90 - තොග ජල සැපයුම් (පලාත් පාලන)<br>➢ 91 - තොග ජල සැපයුම් (ප්‍රජා මූල සංවිධාන) | **50** ට වැඩි | 55.00 | 900.00 |

**ගාස්තු අයක්‍රම වගුව II - වාණිජ බාණ්ඩය**

| ප්‍රභේදය | ජල පරිභෝජනය (ඝන මීටර) | මලාපවහන පරිහරණ අයක්‍රමය (ඝන මීටරයකට) (රු.) | සේවා ගාස්තුව (රු.) |
|---|---|---|---|
| ➢ 65 - රජයට අයත් ව්‍යවසාය ආයතන | 00 - 25 | 130.00 | 500.00 |
| ➢ 70 - වාණිජ ආයතන | 26 - 50 | 130.00 | 1,500.00 |
| ➢ 71 - සංචාරක හෝටල් සහ ආගන්තුක නිවාස | 51 - 75 | 130.00 | 3,000.00 |
| ➢ 72 - නාවික | 76 - 100 | 130.00 | 4,000.00 |
| ➢ 73 - සුළු හා මධ්‍ය පරිමාන නොවන කර්මාන්ත | 101 - 200 | 130.00 | 7,000.00 |
| ➢ 74 - ආයෝජන ප්‍රවර්ධන කලාප කර්මාන්ත | 201 - 500 | 130.00 | 10,000.00 |
| ➢ 75 - සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත | 501 – 1,000 | 130.00 | 20,000.00 |
| ➢ 77 - මිශ්‍ර සංවර්ධන | 1,001 – 2,000 | 130.00 | 30,000.00 |
| ➢ 78 - වරාය නගර | 2,001 – 4,000 | 130.00 | 40,000.00 |
| ➢ 79 - තානාපති කාර්යාල - එකතු කළ අගය මත බදු අය නොවන වාණිජ ආයතන | 4,001 – 10,000 | 130.00 | 50,000.00 |
| ➢ 80 - වෙනත් වාණිජ හා පෞද්ගලික ආයතන<br>➢ 82 - මණ්ඩල පරිශ්‍ර | 10,000 ට වැඩි | 130.00 | 60,000.00 |

**ගාස්තු අයක්‍රම වගුව III - පාසැල්, ආගමික හා පුණ්‍යායතන බාණ්ඩය**

| ප්‍රභේදය | ජල පරිභෝජනය (ඝන මීටර) | මලාපවහන පරිහරණ අයක්‍රමය (ඝන මීටරයකට) (රු.) | සේවා ගාස්තුව (රු.) |
|---|---|---|---|
| ➢ 12 - රජයේ පාසැල්<br>➢ 15 - රජයේ උපකෘත පාඨශාලා<br>➢ 81 - ආගමික සහ පූජනීය ස්ථාන<br>➢ 85 - වෙනත් ලාභ නොලබන ආයතන<br>➢ 88 - රජයේ අනුමත පුණ්‍යායතන | 00 - 10 | 60.00 | 500.00 |
| | 11 - 15 | 60.00 | 750.00 |
| | 16 - 20 | 60.00 | 1,000.00 |
| | 21 - 25 | 60.00 | 1,250.00 |
| | 26 - 30 | 60.00 | 1,500.00 |
| | 31 - 40 | 60.00 | 1,750.00 |
| | 41 - 50 | 60.00 | 2,000.00 |
| | 51 - 75 | 60.00 | 2,500.00 |
| | 75 ට වැඩි | 60.00 | 4,000.00 |

**ගාස්තු අයක්‍රම වගුව IV - රජයේ ආයතන බාණ්ඩය**

| ප්‍රභේදය | ජල පරිභෝජනය (ඝන මීටර) | මලාපවහන පරිහරණ අයක්‍රමය (ඝන මීටරයකට) (රු.) | සේවා ගාස්තුව (රු.) |
|---|---|---|---|
| ➢ 60 - රජයේ ආයතන<br>➢ 61 - යුධ හමුදා පරිශ්‍ර<br>➢ 62 - පොලිස් දෙපාර්තමේන්තු පරිශ්‍ර<br>➢ 63 - රජයේ රෝහල්<br>➢ 64 - පලාත් පාලන ආයතන පරිශ්‍ර | 00 - 25 | 120.00 | 500.00 |
| | 26 - 50 | 120.00 | 1,500.00 |
| | 51 - 75 | 120.00 | 3,000.00 |
| | 76 - 100 | 120.00 | 4,000.00 |
| | 101 - 200 | 120.00 | 7,000.00 |
| | 201 - 500 | 120.00 | 10,000.00 |
| | 501 – 1,000 | 120.00 | 20,000.00 |
| | 1,001 – 2,000 | 120.00 | 30,000.00 |
| | 2,001 – 4,000 | 120.00 | 40,000.00 |
| | 4,000 ට වැඩි | 120.00 | 50,000.00 |

**කොන්දේසි :**

1. සියලුම ජල ප්‍රභවයන් භාවිතා කරමින් සිදු කරනු ලබන අදාළ මාසයෙහි ජල පරිභෝජනය පදනම් කරගෙන සපයනු ලබන මලාපවහන සේවා වෙනුවෙන් ඉහත පරිදි ගාස්තු අයකරනු ඇත.

2. යම් මාසයක භාවිතය ශූන්‍ය වුවද මාසික මලාපවහන සේවා ගාස්තුව සියලු පරිශ්‍රයන් සඳහා අදාළ වනු ඇත.

3. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සැපයුමට අමතරව වෙනත් විකල්ප ජල ප්‍රභව කිහිපයක් භාවිත කරන විට ඒ සඳහා පරිහරණ ගාස්තුව වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් පාරිභෝගිකයා විසින් ගෙවීම් කළ යුතු ය.

4. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ජල සැපයුම රහිතව මලාපවහන සේවා පමණක් ලබා ගෙන ඇති විටක මණ්ඩල නිලධාරීන් කණ්ඩායමක් විසින් පාරිභෝගිකයාගේ ද සහභාගීත්වයෙන් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසුව තීරණය කරනු ලබන ඇස්තමේන්තු අගයකට මලාපවහන ගාස්තුව නියම කරනු ඇත.

5. මලාපවහන සේවා ගාස්තු ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ සැපයුම විසන්ධි කිරීම :
අදාළ මාසයේ ජල ගාස්තු හා මලාපවහන ගාස්තු බිල්පත ලැබී දින 30 ක් ඇතුළත ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ ජල සැපයුම සහ/හෝ මලාපවහන සේවාව 1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 88 (I) වගන්තිය අනුව විසන්ධි කිරීම/ මෙහෙයුම් තත්වයෙන් ඉවත්කිරීම කරනු ඇත.

6. මලාපවහන සේවාව මෙහෙයුම් තත්වයෙන් ඉවත් කිරීම කළහොත් එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා නැවත සම්බන්ධන ගාස්තුවට අමතරව ඒ සඳහා වැයවන පිරිවැය ප්‍රමාණය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අදාළ පාරිභෝගිකයා විසින් ගෙවීම් කළ යුතු ය.

7. කර්මාන්ත ශාලාවලින් ගෘහස්ථ ගණයට අයත් නොවන අපජලය කර්මාන්තයට ආවේනික ප්‍රාථමික පිරිපහදුවකින් පසු ගෘහස්ථ අපජලය ගණයට පත්කළ යුතු අතර, එය 2022 ජනවාරි 27 දිනැති පරිසර පනතේ රෙගුලාසි VI - A හා VI - B වගුවට ඇතුළත් පිරිවිතරයන්ට හෝ එකී නීති සම්පාදනය සම්බන්ධයෙන් පසුව සිදුකෙරෙන වෙනත් යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනයන්ට අනුකූල විය යුතු ය.

8. නියෝග උල්ලංඝනය කිරීම :
මලාපවහන සැපයුම ලබාදී ඇත්තේ කිසියම් නියෝගයක් යටතේ ද එම නියෝගය කවර හෝ පාරිභෝගිකයකු විසින් උල්ලංඝනය කරනු ලබයි නම් 1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතියේ සහ 1992 අංක 13 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධිත) පනතේ අදාළ විධිවිධාන යටතේ හෝ නීති සම්පාදනය සම්බන්ධයෙන් පසුව සිදුකෙරෙන වෙනත් යම් සංශෝධනයක් හෝ යටතේ කටයුතු කරනු ලැබේ.

EOG 06-0065

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.